9423

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Center
...od College
Kandana

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

17 . 11 . 2016

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................ විභාග අංකය :- ..............................

සැලකිය යුතුයි:

## I කොටස

- මෙම කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු පත්‍රය ප්‍රශ්න පත්‍රයට අමුණා භාරදීම අනිවාර්ය බව සලකන්න.

---

- **01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එයට යටින් ඉරක් අඳින්න.**

(01) ලන්දේසීන්ගේ පීඩන සමයේ දී මහනුවර නගරය මැද පූජාසනයක් ඉදිකර වර්ෂාව ඉල්ලා දෙවියන් වහන්සේට යාච්ඤා කළේ,
(1) ගෞරවනීය ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා ය
(2) ගරු මයිකල් රොද්‍රිගු පියතුමා ය
(3) ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා ය
(4) අති උතුම් වොයිටිල්ලා රදගුරු හිමිපාණන් ය

(02) ''ඔබ අතරෙන් එක බැටළුවකු පමණක් හිමි මිනිසකු ඒ බැටළුවා සබත් දිනකදී වළක වැටුනොත්, ඌ ඔසවා ගොඩ ගන්නේ නැද්ද?...'' යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රශ්න කළේ,
(1) අංශභාග රෝගියා සුවකළ අවස්ථාවේදී ය
(2) අතක් පණ නැති මිනිසා සුවකළ අවස්ථාවේදී ය
(3) කුදු ස්ත්‍රිය සුවකළ අවස්ථාවේදී ය
(4) දිය උදර රෝගියා සුවකළ අවස්ථාවේදී ය

(03) ශුද්ධ වූ පාවුළු තුමා උපන් නගරය
(1) ජෙරුසලම ය (2) රෝමය ය (3) තාර්සස් ය (4) ඩැමස්කස් ය

(04) සකේවුස්ගේ සිත් හැරීම හේතුකොටගෙන ඔහු කරන්නට අදහස් කළ උපරිම පරාර්ථකාමී ක්‍රියාව වන්නේ,
(1) තම රැකියාවෙන් ඉවත්වී ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයකු වීම ය
(2) ජේසුස් වහන්සේට ලැගුම් ගැනීම සඳහා තම නිවස සූදානම් කිරීම ය
(3) අසාධාරණ ලෙස තමා අය කළ මුදල් ආපසු ගෙවීම ය
(4) තමා සතු සියල්ලෙන් හරි අඩක් දිළිඳුන්ට පරිත්‍යාග කිරීම ය

(05) ''මම රෝගාතුරුව සිටියෙමි. ඔබලා මා බලාගත්තාහු ද?'' මෙම ප්‍රශ්නයට කිතුනු දරුවෙකු ලෙස ඔබ ලබාදෙන සාර්ථකම ප්‍රායෝගික පිළිතුර විය යුත්තේ,
(1) ''දිනපතා රෝහලට ගොස් රෝගියාගේ සුවදුක් විමසමි'' යන්නයි
(2) ''මහ මඟ රිය අනතුරකට ලක්වූ තැනැත්තාව රෝහලට ඇරලීමි'' යන්නයි.
(3) ''අසරණ රෝගී සහෝදරයෙකුව ශාරීරිකව හා මානසිකව ශක්තිමත් කළෙමි'' යන්නයි
(4) ''රෝහලට මුදලින් පරිත්‍යාගයක් කරන බව පැවසුවෙමි'' යන්නයි

(06) ඔවුහු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද සහභාගීකමෙහි ද.................................. ද යාච්ඤාවෙහි ද නිරතව කල්ගත කළහ. ක්‍රියාපොතෙහි දැක්වෙන ඉහත බයිබල් පාඨයේ හිස්තැන පිරවීමට සුදුසු පදය වන්නේ,

(1) පූප කැඩීමෙහි (2) රොටී කැඩීමෙහි
(3) මෙනෙහි කිරීමෙහි (4) බෙදා ගැනීමෙහි

(07) පාස්කු පූර්ව රාත්‍රී මෙහෙය තුළ ජලය ආසිරි ගන්වන්නේ,

(1) පහන් දැල්වීමේ මෙහෙය තුළය (2) දේව වාක්‍ය මෙහෙය තුළය
(3) ප්‍රසාද ස්නාපන මෙහෙය තුළය (4) දිව්‍ය සත්ප්‍රසාදීය මෙහෙය තුළය

(08) ''සාමකාමී සිසු පෙරමුණ'' පිහිට වූ පුද්ගලයා වන්නේ,

(1) ගරු පීටර් පිල්ලේ පියතුමා ය
(2) ගොඩ්වින් මෙන්ඩිස් මහතා ය
(3) අති උතුම් ඔස්කා රොමේරෝ රදගුරුතුමා ය
(4) අති උතුම් ඩෙස්මන් ටුටු රදගුරුතුමා ය

(09) ශුද්ධාසනය විසින් 2016 වසර නම් කර තිබුණේ,

(1) පවුල් වසර ලෙසය (2) දයාවේ වසර ලෙසය
(3) විශ්වාසයේ වසර ලෙසය (4) පූජක වසර ලෙසය

(10) ''එම්මානුවෙල්'' යන නාමෙහි අරුත වන්නේ,

(1) දෙවියන් වහන්සේ අප සමඟය (2) ආලේප කළ තැනැත්තාය
(3) ගලවා ගනු ලැබූ තැනැත්තාය (4) පුත්‍රයාණන්වහන්සේ අප සමඟය

(11) 1968 වර්ෂයේ දී ආසියාවේ රදගුරු සමුළුව ආරම්භ කළ රදගුරුතුමා වන්නේ,

(1) අති උතුම් මැල්කම් රංජිත් කාර්දිනල් හිමිපාණන්ය
(2) අති උතුම් තෝමස් කුරේ කාර්දිනල් හිමිපාණන්ය
(3) අති උතුම් ලියෝ නානායක්කාර රදගුරු හිමිපාණන්ය
(4) අති උතුම් දියෝගු පිල්ලේ රදගුරු හිමිපාණන්ය

(12) ''සත්‍යතාවයේ ආත්මයාණන් පැමිණි කළ පූර්ණ සත්‍යය කරා යාමට මඟ පෙන්වන සේක'' මෙම දේව ප්‍රකාශය ඔබ ජීවිතය තුළින් ඉටුකර ගත හැකි වන්නේ,

(1) සෑම අවස්ථාවකදීම සත්‍යය ප්‍රකාශ කිරීමෙනි
(2) සෑම අවස්ථාවදීම සත්‍යය අගය කිරීමෙනි
(3) සෑම අවස්ථාවකදීම සත්‍යවාදීව ජීවත්වීමෙනි
(4) සෑම අවස්ථාවකදීම අසත්‍යය හෙළා දැකීමෙනි

(13) හීබෘ බසින් ලියන ලද ශු. බයිබලයේ පැරණි ගිවිසුමට අයත් පොත් ගණන,

(1) 27 කි (2) 39 කි (3) 66 කි (4) 73 කි

(14) ජනවන්දනාවේ අරමුණ වන්නේ,

(1) කිතුනු චාරිත්‍ර වාරිත්‍ර ඉදිරියට ගෙනයාමය
(2) දේව ජනතාව සහෝදරත්වයෙන් බැඳීමය
(3) ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය සිහිපත් කිරීමය
(4) දෙවි මිනිස් සබඳතාවය වර්ධනය කර ගැනීමය

(15) තම ජීවිතය ඵලදායක කර ගැනීමට නම් කිතුනුවා ජේසුස් වහන්සේ හා ඒකාබද්ධව සිටිය යුතු බව පැහැදිලි කිරීමට ප්‍රකාශ කළ උපමාව වන්නේ,

(1) මිදි වැල පිළිබඳ උපමාව යි.
(2) කරුණාවන්ත පියා පිළිබඳ උපමාව යි.
(3) අබ ඇටය පිළිබඳ උපමාව යි.
(4) යහපත් සමරිතානුවරයා පිළිබඳ උපමාව යි.

(16) දෙවිඳුනට ප්‍රතිප්‍රේමය දැක්විය යුතු බව අපට මතක් කර දෙනු ලබන්නේ,

(1) දේව ප්‍රසාද නිධාන මගිනි
(2) ශුද්ධාත්ම දීමනා මගිනි
(3) ආත්මික පුණ්‍ය ක්‍රියා මගිනි
(4) ශුද්ධ වූ සභාවේ පනත් මගිනි

(17) හෘදය සාක්ෂියට අනුකූලව ක්‍රියාකරන තැනැත්තා

A - දේව අභිමානයට අවනත වේ.
B - ප්‍රීතිය හා චිත්ත සාමය ලබා ගනී.
C - ඕනෑම අභියෝගයකට මුහුණ දෙයි.
D - කරන කියන සෑම දෙයකින්ම සාර්ථක ප්‍රතිඵල ලබාගනී.

මේ අතුරින් වඩාත් නිවැරදි වන්නේ,

(1) A, B පමණි (2) A, D පමණි (3) B, C පමණි (4) C, D පමණි

(18) ජේසුස් වහන්සේ කළ ප්‍රකාශ කීපයක් පහත දක්වේ.

A - ''අද ඔබ මා සමඟ පාරාදීසයෙහි සිටින්නෙහිය''
B - ''යහපත් බැටළු එඬේරා මම වෙමි''
C - ''පියාණෙනි, ඔබ හස්තයට මාගේ ආත්මය භාර දෙමි''
D - ''මා අනුව එන්න, මම ඔබ මිනිසුන් දිනාගන්නන් කරමි''

මේ අතුරින් ජේසුස් වහන්සේ කුරුස ගසේ දී කළ ප්‍රකාශ වන්නේ,

(1) A හා B වේ (2) A හා C වේ (3) B හා C වේ (4) C හා D වේ

(19) එම්මාවුස් බලාගිය ශ්‍රාවකයන් විසින් ජේසුස් වහන්සේ හඳුනාගනු ලැබුවේ,

(1) ජේසුස් වහන්සේ ඔවුන් දෙදෙනා සමඟ ගමන් ගත් අවස්ථාවේදී ය.
(2) රාත්‍රියේ නතර වීමට ඔවුන් ජේසුස් වහන්සේට ආරාධනා කළ අවස්ථාවේදී ය.
(3) ජේසුස් වහන්සේ ශුද්ධ ලියවිලි පාඨයන් පැහැදිලි කළ අවස්ථාවේදී ය.
(4) ජේසුස් වහන්සේ රොටි කඩා ඔවුන් දෙදෙනාට දුන් අවස්ථාවේදී ය.

(20) උත්තම පූජක යාච්ඤාව ජේසුස් වහන්සේ,

(1) ශ්‍රාවකයන්ට ඉගැන්වූ යැදුමකි
(2) ශ්‍රාවකයන් සමඟ කළ යැදුමකි
(3) තමන් විසින්ම දෙව්පියාට කරන ලද යැදුමකි
(4) ශ්‍රාවකයින් තෝරා ගැනීමට පෙර කළ යැදුමකි

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර එම ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) ''ජනවන්දනාවේ උතුම්ම පිළිවෙත දිව්‍ය පූජාවයි'' 9 ශ්‍රේණියේ දරු දැරියන් ලෙස ඔබ විසින් මේ වාරයේ සංවිධානය කරන ලද දිව්‍ය පූජාව ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ''එකමුතුකමේ භෝජන සංග්‍රහය'' හඳුන්වන නම කුමක් ද? (ලකුණු 02)

(2) දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

(3) ඉරුදින දිව්‍ය පූජාවේ දී පළමු කියවීම හා දෙවන කියවීමට යොදා ගන්නා ශුද්ධ බයිබලීය පොත් මොනවා ද? (ලකුණු 04)

(4) ඔබ විසින් සංවිධානය කළ දිව්‍ය පූජාවේ දී ඔබ දායකත්වය දැක්වූ අවස්ථා හතරක් ලියන්න. (ලකුණු 04)

(5) පියතුමාගේ දේශනයෙන් ඔබගේ ජීවිතයට ලැබුණු පණිවුඩ දෙකක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

(02) (1) පුරාණ ගිවිසුම තුළ සඳහන් දෙවියන් වහන්සේට යාග ඔප්පු කළ පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(2) දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය තුළ දක්නට ලැබෙන ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 03)

(3) දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩවසන ජේසුස් වහන්සේට ඔබගේ ජීවිතය භාර කරමින් වචන පනහකින් පමණ කෙටි යැදුමක් ලියන්න. (ලකුණු 06)

(03) (1) ජේසුස් වහන්සේ කැඳවනු ලැබූ ප්‍රථම ශ්‍රාවකයන්ගෙන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(2) නව ගිවිසුම තුළ දැකිය හැකි ප්‍රාතිහාර්ය වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 04)

(3) ලාසරස්ව මරණයෙන් උත්ථානවීමේ ප්‍රාතිහාර්යය කෙටියෙන් ලියන්න. (ලකුණු 06)

(04) (1) පාස්කු පූර්ව රාත්‍රී මෙහෙයේ ප්‍රධාන කොටස් වලින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ඉශ්‍රායෙල් ජනතාවට පාස්කු භෝජනය අනුභව කිරීම සම්බන්ධව මෝසෙස් තුමා මගින් දුන් අවවාද තුනක් ලියන්න. (ලකුණු 03)

(3) වත්මන් සමාජය තුළ ජීවත්වන ඔබ කීකරු දරුවෙකු ලෙස ජීවත්වීමේ දී මුහුණදීමට සිදුවන අභියෝග ජය ගැනීමට කළ හැකි දේවල් හයක් ලියන්න. (ලකුණු 06)

(05) (1) ශුද්ධ බයිබලයේ නව ගිවිසුමට අයත් ඉතිහාස පොත් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ ප්‍රධාන තේමාව ලියන්න. (ලකුණු 03)

(3) ඔබ ජීවත්වන පරිසරය තුළ දේව වචනය ප්‍රකාශ කිරීමට ඔබට කළ හැකි ක්‍රියා හයක් ලියන්න. (ලකුණු 06)

(06) (1) පුරාණ ගිවිසුම තුළ තම යුතුකම් ඉටුකළ පුද්ගල කණ්ඩායම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) යහපත් සමරිතානුවරයා පිළිබඳ උපමා කථාවෙන් ජේසුස් වහන්සේ පෙන්වා දුන්නේ කුමක්ද? (ලකුණු 03)

(3) ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ ඔබට පැවරෙන කිතුනු යුතුකම් හයක් ලියන්න. (ලකුණු 06)

9405

(07) පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න. (පේළි 06ක්වත් එක් සටහනකට අවශ්‍ය වේ.)

(1) ගොඩ්වින් මෙන්ඩිස් මහතා

(2) ශුද්ධවූ මේරි යුප්‍රේසියාතුමිය

(3) පෙන්තකොස්ත මංගල්‍යය

(4) ඉරුදින ශුද්ධ ලෙස ගත කිරීම

(ලකුණු 5 1/2 × 2 = 11)

9 ශ්‍රේණිය
රෝමානු කතෝලික

Learning Resource Center
R
De Mazenod College
Kandana